**<u>ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් නම ඉවත් කිරීම/</u>**
**<u>ව්‍යාපාර නාමය අවලංගු කිරීම</u>**

## අවශ්‍ය ලිපිලේඛන

1. (බ.ප.) ආර් 7 අයදුම්පත්‍රය
2. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපත
3. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට නිකුත් කල ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය
4. ග්‍රාම නිලධාරී වාර්තාව (මෙය ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබීම අනිවාර්ය වේ.)
5. ව්‍යාපාර කටයුතු අවසන් කළ බවට අවසන් කල දිනය සඳහන් කරමින් හා ව්‍යාපාරය අවසන් කරන දිනය වන විට ව්‍යාපාරය වෙනුවෙන් ගෙවීමට බැරකම් නොමැති බව දක්වමින් ව්‍යාපාර හිමිකරුවන්ගෙන් දිවුරුම් ප්‍රකාශයක්
6. රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි
7. මේ සඳහා ගාස්තු අය කරනු නොලැබේ.

## විශේෂ කරුණු

**<u>ව්‍යාපාරයක් අවලංගු කිරීමේදී</u>**

- තනි පුද්ගල ව්‍යාපාරයක අයිතිකරු මියගොස් ඇති අවස්ථාවක, ඔහුගේ ඥාතීත්වය / සම්බන්ධතාවය තහවුරු කරනු ලබන නියෝජිතයෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු මියගොස් ඇති අවස්ථාවක, ව්‍යාපාරය එකවර වැසිය නොහැක. අනෙක් හවුල්කරුවන් විසින් මියගිය හවුල්කරුගේ මරණ සහතිකය සමඟ වෙනස්කමක් අයදුම්පත් ඉදිරිපත් කර නව සහතිකය ලබාගෙන , ඉන්පසුව ව්‍යාපාරය වැසීමට කටයුතු කළ යුතුය.
- ව්‍යාපාරය අවලංගු කර මසක් ඇතුලත අයදුම්පත් භාර දිය යුතුය.
- දඩ මුදලක් අය නොකෙරේ.

**<u>හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට</u>**

- හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු මියගොස් ඇති අවස්ථාවක, අනෙක් හවුල්කරුවන් විසින් මියගිය හවුල්කරුගේ මරණ සහතිකය සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- මියගිය හවුල්කරුගේ නාමය ඉවත් කර ගැනීම සඳහා මියගිය හවුල්කරුවන්ගේ යැපෙන්නන්ගෙන් කැමැත්ත පල කිරීමේ දිවුරුම් ප්‍රකාශයක් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ ලේඛණ සමග ඉදිරිපත් කල යුතුය.
- ව්‍යාපාර හිමිකරුවන් විසින් අයදුම්පතේ යොදා ඇති අත්සන සමඟ ලිපිගොනුවේ ඇති අත්සන් නොසැසඳේනම් දිවුරුම් ප්‍රකාශයක් මඟින් හෝ කාර්යාලයට කැඳවීම මඟින් නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතුය.